www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# නොබෙල් යුද ත්‍යාගය

**The Nobel War Prize**

**2009 ඔක්තෝබර් 10**

2009 නොබෙල් සාම ත්‍යාගය ලැබීමට සුදුස්සා බැරැක් ඔබාමා යනුවෙන් නෝර්වේ හි නොබෙල් කොමිටිය විසින් පසුගිය සිකුරාදා කරන ලද නිවේදනය හමුවේ ලොව පුරා ජනයා විශ්මයට පත් වූහ.

කිසිදු ක්ෂේත්‍රයක පෙනෙන තරමේ සාර්ථකත්වයක් නොමැතිවම සිය ධුරයේ මාස නවයකටත් අඩු කාලයකින් ඔබාමා තෝරා පත් කරගත හැකි වූයේ කෙසේදැයි බොහෝ දෙනා ප්‍රශ්න කලහ. ත්‍යාගය සඳහා නාම යෝජනා දීමේ අවසන් දවසට හරියටම දින 11 කට පෙරය, ඔබාමා ධූරයේ වැඩ භාර ගනු ලැබුවේ.

කෙසේ වුවද වඩාත් අර්ථභාරී වන්නේ වැඩ භාර ගැනීමෙන් පසු ඔබාමා සිදුකොට ඇති කිසිවක් සාමය සමග කිසිදු සම්බන්ධකමක් නොමැති වීමයි.

මේ සම්බන්ධයෙන් අදහස් පල කිරීමට මධ්‍ය උදෑසන රෝස උද්‍යානයේ පෙනී සිටි ඔබාමා සිය ප්‍රකාශය ආරම්භ කරනු ලැබුවේ සාම ත්‍යාගය ලැබීම සම්බන්ධයෙන් තමා දැඩි විශ්මයටත් අපහසුතාවයටත් පත්වූ බවයි. ඔහු පසුව ධවල මන්දිරයට පෙරලා පිය නැගුවේ සිය යුද කවුන්සිලය හමුවී ඇෆ්ගනිස්ථානයට දහස් ගනනින් යුද භටයන් යැවීමට සහ එරට තුල සහ පකිස්ථානු දේශ සීමාව තුල බෝම්බ හෙලීම ඉහල දැමීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමටය.

ඉරානයට එරෙහි වක්‍ර තර්ජන නිකුත් කිරීමට සිය ප්‍රකාශනය භාවිතා කල ඔබාමා, තම නායකත්වය යටතේ සිදුවූ යුද්ධ දෙකක් සහ හමුදා වාඩිලා ගැනීම් ගැන සඳහන් කරමින් තමා ප්‍රධාන අනදෙන නිලධාරියා යැයි ප්‍රකාශ කලේ ප්‍රස්තුතයෙන් පිට පනිමිනි.

නොබෙල් කමිටුව ඔහුගේ "න්‍යෂ්ටික අවිවලින් තොර ලෝකයක් පිලිබඳ දැක්ම" වෙනුවෙන් ඔහුව වර්නනා කල අතර ඔබාමා ප්‍රකාශ කලේ මේ අරමුන "තම ජීවිත කාලය තුල සාක්ෂාත් කල නොහැකි වනු ඇති"බවයි. මොස්කව් වල පැවති සාකච්ඡා වලදී ඔහුගේ පරිපාලනය අවම වශයෙන් න්‍යෂ්ටික අවි ප්‍රහාරක 1,500 ක් (වෝර් හෙඩ්ස්) තබා ගැනීමේ අයිතිය ඉල්ලා තිබෙන තතු යටතේ ඔහු කථා කරනුයේ කොතනදීද යන්න ඔහු දනී.

ඔහු හඟවනු ලබන "දැක්ම" සහ සිය පරිපාලනයේ යුදකාමී ප්‍රතිපත්ති වල යථාර්තය අතර පැහැදිලි වෙනසක් ඇති කරමින් ඔබාමා ප්‍රකාශ කලේ "අපි ලෝකය ගැන දන්නා අයුරින් අපට ලෝකයට මුහුන දීමට සිදුවී තිබේ" යනුවෙනි.

මතුපිටින් සලකා බැලීමේදී ඇමරිකානු ජනාධිපතිට සාම ත්‍යාගයක් පිරිනැමීම විකාර රූපී වේ. තෝරා ගැනීම ඔබාමා පරිපාලනයට පැහැදිලි අපහසුතාවයක් පමනක් විය හැකි බවට පුලුල්ව පැතිරුනු අනතුරු ඇඟවීම් තිබේ. ඇෆ්ගනිස්ථානයේ සිවිල් ජනතාවට බෝම්බ ප්‍රහාර එල්ල කිරීම වැනි යුද අපරාධවලට වගකිව යුතු හමුදා අනදෙන නිලධාරියෙකු සාමයේ ආරක්ෂකයා ලෙස ප්‍රකාශයට පත් කිරීම කෙසේ නම් විය හැකිද? පසුගිය මැයි මාසයේ සිදුකරන ලද එවන් ප්‍රහාරයකින් මිනිසුන් ගැහැනුන් සහ දරුවන් සියයකට අධික ප්‍රමානයකගේ ජීවිත අහිමි කෙරිනි.

මේ දක්වාම, නොබෙල් සාම ත්‍යාගය ලැබීම හැමවිටම සැකසහිත බෙදීමක් වී තිබේ. යුද අපරාධකාරයෙකු ලෙස අත් අඩංගුවට පත් වේ යැයි බියෙන් අද වන විට එක්සත් ජනපදයෙන් පිටත යාමට නොහැකි හෙන්රි කිසින්ජර් ට 1973 දී මෙම ත්‍යාගය පිරිනැමීමට තීරනය කිරීමේ සිට මේ දක්වා සත්‍ය වශයෙන්ම නොබෙල් ත්‍යාගයේ කීර්තිය යලි කිසිදිනක ලබා ගැනීමට නොහැකි වී තිබේ. ඔහුගේ සම ත්‍යාග ලාභියා වූ, පැරිස් සාම සාකච්ඡා මෙහෙය වූ වියට්නාම් නායක ලී ඩක් දෝ, ගිවිසුම තම රටට කිසිදු සාමයක් ගෙන එනු නොලැබූ බව පෙන්වා දෙමින් ත්‍යාගය ලබා ගැනීම ප්‍රතික්ෂේප කලේය.

වසර කීපයකට පසු මෙනාචෙම් බෙගින් ත්‍යාගය සඳහා තෝරා ගනු ලැබීය. ඔහුගේ සම ත්‍යාගලාභී ඊජිප්තුවේ අන්වර් සදාත් සමග කැම්ප් ඩේවිඩ් ගිවිසුමට එලඹීම සම්බන්ධයෙන් ගරු බුහුමන් දක්වමින්, ඝාතකයෙකු සහ ත්‍රස්තවාදියෙකු ලෙස ඔහු

පවත්වා ගෙන ගිය දිගුකාලීන දිවි පෙවෙත නොතකා, නොබෙල් කමිටුව ඔහුව තෝරා ගනු ලැබීය.

එම ත්‍යාගයම 2002 දී සිය පරිපාලනය යටතේ මිලියනයක ජීවිත වලට වගකිවයුතු ඇෆ්ගනිස්ථාන යුද්ධය ආරම්භ කල ජිමී කාටර්ට ද ලබා දෙන ලදී.

ඔවුන් මෙන්ම, සිය ප්‍රතිපත්ති උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් කමිටුවට චෝදනා කල නොහැක. ත්‍යාගයේ නිර්මාතෘ ඇල්ෆ්‍රඩ් නොබෙල්, ඩයිනමයිට් සොයා ගත් පුද්ගලයා විය. නීතිවිරෝධී ඉලක්ක අතුගා දැමීම සඳහා සැලසුම් කල රාත්තල් 30,000 ක බෝම්බයක් නැතහොත් මහා අවි විනිවිදිනය (Massive Ordnance Penetrate –MOP) නිශ්පාදනය කිරීම වේගවත් කිරීමේ ලා පෙන්ටගනය දැරූ ප්‍රයත්නයෙන් ඔහු නිසැකවම රැවටෙන්නට ඇත. ආයුධය සූදානම් කරමින් සිටියේ ඉරානයට එරෙහිව භාවිතා කරනු පිනිසය.

ඔබාමාගේ "දැක්ම" සහ "ලෝකයේම අවධානය ඇදගනිමින් සිය ජනතාවට යහපත් අනාගතයකට බලාපොරොත්තු දීම" පිලිබඳව වර්නනා කලද, නොබෙල් කමිටුව, ඔබාමා තෝරා ගනු ලැබුවේ ඔහුගේ මැතිවරන ව්‍යාපාරයේ බොරු පූර්ණානම් මත පදනම් වී නොවේ.

නොබෙල් සාම ත්‍යාගය යනු, හැමදාමත් සිදුවී ඇති ආකාරයට නිශ්චිත ප්‍රතිපත්ති ප්‍රවර්ධනය කිරීමේ ඉලක්කය ඇතිව දෙනු ලබන දේශපාලනික ත්‍යාගයකි.

තෝරා ගැනීම කරනු ලැබුවේ අන්ත දක්ෂිනාංශයේ සිට සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන් දක්වා විහිදුනු ප්‍රධාන පක්ෂ වලින් ඇදගනු ලැබූ නෝර්වේජියානු පාර්ලිමේන්තුවේ සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් මගිනි. එහි තීරන සමස්ථයක් ලෙස යුරෝපීය පාලන ප්‍රභූව ඇතුලත පවත්නා ආස්ථානයන් පිලිබිඹු කරයි.

තෝරා ගැනීම යටින් පවත්නා නරුමත්වය පල කරමින් කමිටුවේ සභාපති සහ හිටපු නෝර්වීජියානු අග්‍රාමාත්‍යවරයෙකු වූ තෝර්බ්ජෝන් ජැග්ලන්ඩ් පසුගිය සිකුරාදා *නිව්යෝර්ක් ටයිම්ස්* පුවත්පත සමග කල සම්මුඛ සාකච්ඡාවකදී ඔබාමාගේ තෝරා ගැනීම ආරක්ෂා කලේය. "අරගල කරන සහ මතවාදී මිනිසුන් හඳුනා ගැනීම කමිටුවට වැදගත්, ඒත් අපට හැම අවුරුද්දකම ඒක කරන්න බැහැ" ඔහු ප්‍රකාශ කලේය. "අපි කාලෙන් කාලෙට යථා දේශපාලන රාජධානියට යා යුතුයි"

ත්‍යාගය සඳහා කැපී පෙනෙන ඇමරිකානු දේශපාලකයන් දෙදෙනෙකු මෑතකදී තෝරා ගැනීම සම්බන්ධයෙන් මෙම යථා දේශපාලනය, නිසැකවම තීරනාත්මක භූමිකාවක් රඟපා තිබේ. එනම් 2002 දී කාටර්ව සහ 2007 දී අල්ගෝර් ව තෝරා ගැනීමයි. ඉරාකයට එරෙහි යුද්ධය මුවවිටෙහි කාටර්ව තෝරාගනු ලැබුවේ බුෂ් පරිපාලනයේ ආක්‍රමනශීලී ඒකපාර්ශ්වීයවාදයට විරෝධතාවය දැක්වීමක් ලෙසිනි. 2008 මැතිවරනයට පෙරාතුව, අල් ගෝර් (2000 මැතිවරනයේදී ඩිමොක්‍රටික් ජනාධිපති අපේක්ෂක) වෙත මෙම ත්‍යාගය ප්‍රදානය කිරීම මගින් ඉඟිකරනු ලැබුවේ යුරෝපයට බුෂ් පරිපාලනයෙන් කැඩීයාමට අවශ්‍ය වූ බවය.

එම කාලවලදී ත්‍යාගය යොදාගනු ලැබුවේ ඇමරිකානු විදේශ ප්‍රතිපත්තිය විවේචනය කිරීමක් ලෙස වන අතර මේවර එය ප්‍රදානය කිරීම මගින් කරනු ලබන්නේ එම ප්‍රතිපත්තිය අනුමත කිරීමකි. ජැග්ලන්ඩ් ප්‍රකාශ කලේ "අපි බලාපොරොත්තු වෙනවා ඔහු කරන්න උත්සාහ කරමින් සිටින දේ ඉදිරියට ගෙන යාමට මෙය යන්තමින් හෝ දායක වෙයි කියා" යනුවෙනි.

ඇෆ්ගනිස්ථානයට වඩ වඩාත් භට කන්ඩායම් යැවීමට සූදානම් කරන තතු තුල සාම ත්‍යාගය ඔබාමාට පිරිනැමීම හේතුවෙන් මෙහි පරස්පරවිරෝධතාවයන් වඩාත් කැපී පෙනේ. යුද්ධයන් සාමය සඳහා කරගෙන යන්නක් ලෙස යුරෝපයේ අනුමැතියේ මුද්‍රාව වොෂිංටනයට ලබා දෙමින්, මෙම ත්‍යාගය පිරිනැමීමෙන් බලාපොරොත්තු වනුයේ ඇෆ්ගනිස්ථානය තුල වොෂින්ටනයේ හමුදා බලපෑම ඉහල දැමීම, පකිස්ථානයට එරෙහි එහි ප්‍රහාර සහ ඉරාකයේ අඛන්ඩව පවත්නා වාඩිලා ගැනීම නීත්‍යානුකූල කිරීමය.

මෙය සේවය කරනු ලබන්නේ ඔබාමා පරිපාලනය යටතේ ආරම්භ කල එමෙන්ම අනාගත පාලකයින් තවමත් සැලසුම් කරමින් පවතින යුද්ධවලට ඇමරිකාව තුලමත් ජාත්‍යන්තරවත් පවත්නා මහජන විරෝධය යටපත් කිරීමටය.

යුරෝපීය බලයන් ඇෆ්ගනිස්ථාන යුද්ධයට දක්වන සහයෝගී ආස්ථානය, එහි පුවත්පත් තුල වඩාත් නිරන්තරව ප්‍රකාශයට පත්වේ. උදාහරනයක් ලෙස බ්‍රිතාන්‍ය ඩේලි ඉන්ඩිපෙන්ඩන්ට් පුවත්පත යුද්ධය සඳහා ඇමරිකානු සොල්දාදුවන් 40,000 කටත් වැඩියෙන් යැවීමට "මූලධර්මාත්මකව" සහය දෙන බව ප්‍රකාශ කරමින් කතුවැකියක් පල කලේය.

ඒ අතරම ජර්මනිය, ප්‍රන්සය, සහ වෙනත් රටවල්, ඉරානය සම්බන්ධයෙන් ද තම ආස්ථානයන් වෙනස් කරගනිමින් දරදඬු පියවර සඳහා වොෂිංටනය ගෙන යන උද්ඝෝෂනයට පක්ෂපාතිත්වය දක්වා තිබේ.

යුරෝපීය පාලන කවයන් ඔබාමා තුලින් දකිනුයේ සාමයේ වීරයෙකු නොව, බුෂ් පාලනාධිකාරියේ ඒකපාර්ශ්වීය වාදයෙන් තරමක් ඈත්වූ

සහ ඇමරිකානු අධිරාජ්‍යවාදයේ මූලෝපායික අරමුනු සාක්ෂාත් කරගැනීමට යුරෝපීය පාර්ශ්වයන්ගේ සහය ලබා ගැනීමට කැමති අයෙකු ලෙසය.

නිසැකවම, යුරෝපා ආන්ඩු ගනන් බලනුයේ ඇමරිකානු හමුදා මැදිහත්වීම්වලට ඔවුන්ගේ සහය දැක්වීම, මධ්‍යම ආසියාවේ සහ පර්සියානු ගල්ෆ් කලාපයේ  බලශක්ති සම්පත් සූරාකෑමට අවස්ථාවක් නිර්මානය කරනු ඇති බවටය.

ඊටත් වැඩියෙන්, මෙම යුද්ධ නීත්‍යානුකූල කරමින් සහ ඇමරිකානු විදේශ ප්‍රතිපත්තියේ බහුපාර්ශ්වීයත්වයට නැවත හැරී ගැනීම ප්‍රවර්ධනය කරමින්, යුරෝපීය බලයන්, හමුදාකරනය වෙත තමාගේම හැරීගැනීම නීත්‍යානුකූල කිරීමට සහ තම ජනතාව අතර යුද්ධයට එරෙහි විරුද්ධත්වය පාගා දැමීමට මාර්ගයක් මේ තුලින් දකියි.

ලෝකයේ දැවැන්තම මිලිටරි බලය සාමය දෙසට හැරෙමින් සිටී යැයි බලාපොරොත්තුවේ සංඥා නිකුත් කරනු වෙනුවට ඔබාමාට නොබෙල් ත්‍යාගය පිරිනැමීම මත් එම යුද්ධයට දෙන ලද අනුමැතියක් වන අතර එය ලෝක ධනවාදයේ උග්‍රවෙමින් පවත්නා අර්බුදය මගින්,  මිලිටරිකරනය කරා නැවත යෑමේ තත්ත්වයන් නිර්මානය කිරීමක් සහ ජාත්‍යන්තර ගැටුම් පුලුල් වීමේ තර්ජනයක් ඇති බවට කෙරෙන අනතුරු ඇඟවීමකි.

**බිල් වෑන් ඕකන්**

© www.wsws.org